# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# Police Media Division

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ. අංකය<br>த.பெ.இ<br>P.O.Box No | 517 | | | ෆැක්ස්<br>தொலை நகல்<br>Fax | 011-2329500 |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 011-2384024<br>011-2395605 | වෙබ් ලිපිනය<br>இணைய தளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E mail | dir.media@police.lk |
| මගේ අංකය<br>எனது இல<br>My No | 573 / 2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.04.11<br>පැය 2200 |


## මාධ්‍ය නිවේදන

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**නිසි බලධරයෙකුගේ බලපත්‍රයක් නොමැතිව නීති විරෝධී ලෙස ඉන්ධන අලෙවි කරන පුද්ගලයන් සම්බන්ධව වැටලීම් තවදුරටත් සිදු කෙරේ.**

දිවයින පුරා ඇති ඉන්ධන හල් ආශ්‍රිතව මහජනතාව පෝලිම්වල රැඳී සිටිමින් බැරල්, බූලි හා කෑන් වැනි හිස් භාජනවලට ඉන්ධන ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. විශේෂයෙන්ම ඉන්ධන වල තිබෙන හිඟතාවයත්, විදුලිය විසන්ධි කිරීමත් හේතුවෙන් පසුගිය දිනවල මේ සම්බන්ධයෙන් ඉතාමත්ම සානුකම්පිතව ක්‍රියාකරන ලදී. නමුත් මේ වන විට මෙය ප්‍රයෝජනයට ගෙන බොහෝ පිරිස් ජාවාරමක් ලෙස සිදු කරන බව නිරීක්ෂණ වී ඇත.

ඉන්ධන හල් වලින් ඉන්ධන ලබාගෙන නිවෙස් වෙත හෝ වෙනත් ස්ථානවලට රැගෙන ගොස් ඒවා අධික මිලට අලෙවි කිරීමේ ජාවාරම් පවත්වාගෙන යන ආකාරයක් නිරීක්ෂණය වී ඇත. මේ හේතුවෙන් වාහන අත්‍යවශ්‍ය කාරණා සඳහා ඉන්ධන ලබා ගැනීමට පැමිණෙන මහජනතාව විවිධ අපහසුතාවලට ලක් වන බවත් නිරීක්ෂණය වී ඇත.

මේ හේතුවෙන් නිසි බලධරයෙකුගේ බලපත්‍රයක් නොමැතිව ඉන්ධන රැගෙන ගොස් විවිධ ස්ථානවල තබා ගනිමින් අලෙවි කිරීමේ යෙදෙන පුද්ගලයන් සම්බන්ධයෙන් සොයා බලා වැටලීම් කර අත්අඩංගුට ගන්නා ලෙසට පොලිස්පති තුමා විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ට හා පොලිස් ස්ථාන වෙත උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව පසුගිය දිනවල දිවයින පුරා වැටලීම් 68ක් සිදුකර පෙට්‍රල් ලීටර් 8025ක්, ඩීසල් ලීටර් 726 සහ භූමිතෙල් වැනි ඉන්ධන අලෙවි කරන ස්ථාන වටලා සැකකරුවන් සහ ඔවුන් භාරයේ තිබුණු ඉන්ධන අත්අඩංගුවට ගන්නා ලදී.

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත, 1979 අංක 34 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන, පාලනය සහ සැපයීම පිළිබඳ නියාමන පනත සහ 1887 අංක 06 දරණ ඛනිජ තෙල් ආඥා පනත යන පනත් වලින් ලැබී තිබෙන නෛතික ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා පොලිසිය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සම්බන්ධීකරණය වී ඒකාබද්ධව වැටලීම් සිදුකර අවශ්‍ය අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සිදුකරනු ලැබේ. හෙට දින සිට සිදුකරනු ලබන වැටලීම් ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

මහජනතාවගේ අවශ්‍යතාවයන්ට ඉන්ධන ලබා ගැනීමට හැකි වන අතර, පරිභෝජනය සඳහා භූමිතෙල් ලබා ගැනීමටත් කිසිදු බාධාවක් නොමැත. මේ ආකාරයට ඉන්ධන රැගෙන ගොස් බලපත්‍රයක් නොමැතිව අලෙවි කරන ස්ථාන වැටලීම් සිදුකරන අතර, මෙම වැටලීම් හෙට සිට දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ඉහත වරද සංඥෙය වරදක් වන බැවින් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමේ හැකියාව ඇති අතර, ඔවුන්ට එරෙහිව ගරු අධිකරණයේ නඩු පවරා නීත්‍යානුකූලව කටයුතු කරනු ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**